## සබරගමුව පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

1 ශ්‍රේණිය - ගණිතය / දෙවන වාරය / ජුලි මස 3 සතිය

සැකසුම - රත්නපුර කලාප අධ්‍යාපන කාර්යාලය

ඒ. එම්. එම්. ඩී. කුමාරි - ර/ ජේසු බිළිඳුගේ කන්‍යාරාම ජාතික පාසල


### 22 පාඩම - 1 සිට 9 තෙක් ක්‍රම සූචක සංඛ්‍යා හඳුනා ගැනීම

අපි 1 ඉඳන් 9 ට ගණන් කළා මතකයි නේ ද? ආයෙත් වතාවක් මතක් කරගනිමු.

1 2 3 4 5 6 7 8 9

දැන් අපි තරඟයක් බලන්න යමු ද?

මෙන්න මෙයාලා රේස් එකක් යනවා..... බලන්න සමහර අය පස්ස බල බල දුවනවා.



ඔයාලා ළඟත් මේ වගේ චූටි යාළුවෝ ඉන්නව නම් මේ වගේ රේස් එකක් තියල බලමු ද?

1 කියන්න මෙතනින් පළවෙනියා කවු ද? ..........................

2 තුන්වෙනියා කවු ද?..........................

3 ඊළඟට හත් වෙනියට යන්නෙ කවු ද? ..........................


4 මේ තරඟයේ අන්තිමයා කවු ද? ඒ කියන්නේ නවවෙනියා ..........................

5 පස් වෙනියට යන කෙනා පාට කරන්න.

6 දෙවෙනියාගේ හිසට තොප්පියක් දාන්න.

7 තලගොයි පැටියා කී වෙනියා ද? ..........................

මේ බලන්න වාහන රේස් එකක්



1 පළවෙනියට යන වාහනය කුමක් ද? ..........................

2 තුන්වෙනියට යන වාහනය පාට කරන්න..........................

3 දෙවෙනියට යන වාහනය වටා රවුමක් අඳින්න. ..........................

4 හතරවෙනියට යන වාහනය ඉදිරිපසින් කොඩියක් රඳවා ඇති අන්දම අඳින්න.

5 පස්වෙනියට යන වාහනයට පිටුපසින් මිනිසෙක් අඳින්න.

ඔන්න එහෙනම් පළවෙනියට අභ්‍යාස අවසන් කරපු කෙනාට

මෙන්න මේ හෙලිකොප්ටරයේ නැගල රවුමක් යන්න පුළුවන්.

